කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
**Department of Meteorology**

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

ශ්‍රී ලංකාව සඳහා සාමාන්‍යය කාලගුණ අනාවැකිය

# GENERAL WEATHER FORECAST FOR SRI LANKA

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි.
Issued by Forecasting Division, National Meteorological Centre.

**2021 මැයි මස 16 දින සඳහා කාලගුණ අනාවැකිය**
**2021 මැයි මස 16 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

**බස්නාහිර, සබරගමුව, මධ්‍යම සහ වයඹ පළාත්වලත් ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලත් විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.**

**උතුරු සහ උතුරු මැද  පළාත්වල වැසි වාර කිහිපයක් ඇතිවේ.**

**නැගෙනහිර සහ ඌව  පළාත්වල ස්ථාන ස්වල්පයක සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.**

**සබරගමුව පළාතේත් කළුතර, ගාල්ල, මාතර, නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්කවලත් ඇතැම් ස්ථානවලට මි.මී. 50 ක පමණ තරමක තද වැසි ද ඇතිවිය හැක.**

**දිවයින හරහා සුළගේ වේගය විටින් විට පැ.කි.මී. (30-40) දක්වා වැඩි විය හැක. විශේෂයෙන්ම මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශ වලත්, උතුරු, උතුරු-මැද සහ වයඹ පළාත්වලත් සුළගේ වේගය ක්ෂණිකව පැ.කි.මී. 50 දක්වා වැඩි විය හැක.**

**ගිගුරුම් සහිත වැසි සමග ඇතිවිය හැකි තාවකාලික තද සුළං වලින් සහ අකුණු මගින් සිදු වන අනතුරු අවම කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස ජනතාවගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.**

## WEATHER FORECAST FOR 16 May 2021
**Issued at 05.30 a.m. on 16 May 2021**

Showers or thundershowers will occur at times in Western, Sabaragamuwa, Central and North-western provinces and in Galle and Matara districts.

Several spells of showers will occur in Northern and North-central provinces.

Showers or thundershowers will occur at a few places in Eastern and Uva provinces during the evening or night.

Fairly heavy falls about 50 mm can be expected at some places in Sabaragamuwa province and in Kaluthara, Galle, Matara, Nuwara-Eliya and Kandy districts.

**Wind speed can increase up to (30-40) kmph at times over the island. Wind speed can gusting up to 50 kmph particularly in Western slope of the Central hills, Northern, North central and North-western provinces.**

**General public is kindly requested to take adequate precautions to minimize damages caused by temporary localized strong winds and lightning during thundershowers.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

# දිවයින වටා මුහුදේ කාලගුණය සහ ස්වභාවය
# WEATHER AND STATE OF SEA AROUND THE ISLAND

ජාතික කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයේ, අනාවැකි අංශය මගින් නිකුත් කරන ලදි
Issued by Forecasting Division, National Meteorological Centre

ඉදිරි පැය 24 ට දිවයින වටා වන මුහුදු ප්‍රදේශ සඳහා කාලගුණ අනාවැකිය

ගිනිකොණ දිග අරාබි මුහුද ආශ්‍රිතව පැවති 'ටවුටේ' සුළි කුණාටුව චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී, මැයි 15 වන දින රාත්‍රී 11.30 ට පමණ උතුරු අක්ෂාංශ 14.4 ත් නැගෙනහිර දේශාංශ 72.7 ත් ආසන්නව ස්ථානගතව පැවතුනි. මෙම පද්ධතිය ඉදිරි පැය 06 තුල ඉතා චණ්ඩ සුළි කුණාටුවක් දක්වා වර්ධනය වී උතුරට බරව වයඹ දිශාවට ගමන් කරමින්, 18 වන දින සවස් කාලයේදී ඉන්දියාවේ ගුජරාට් වෙරළ තීරය හරහා ගමන් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

<u>ඉහත මුහුදු ප්‍රදේශවල ධීවර හා නාවුක කටයුතු වල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.</u>

**වැසි තත්ත්වය:**

කන්කසන්තුරය සිට මන්නාරම සහ කොළඹ හරහා ගාල්ල දක්වා වන මුහුදු ප්‍රදේශවල විටින් විට වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ. සෙසු මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇතිවේ.

**සුළඟ:**

දිවයින වටා වන මුහුදු ප්‍රදේශවල සුළං බස්නාහිර සිට නිරිත දක්වා දිශාවලින් හමා එයි. කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (40-50) පමණ වේ. සෙසු මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය පැ.කි.මී. (30-40) පමණ වේ.

කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 60 දක්වා ද පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළගේ වේගය විටින් විට පැ.කි.මී. 50 දක්වා ද වැඩි විය හැක.

**මුහුදේ ස්වභාවය:**

කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු හෝ ඉතා රළු විය හැක. පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු විය හැක. සෙසු මුහුදු ප්‍රදේශ තරමක් රළු විය හැක.

මන්නාරම සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන වෙරළ ආසන්න මුහුදු ප්‍රදේශවල මුහුදු රළ මීටර්. **2.0 – 2.5** ක් පමණ (මෙය ගොඩබිමට එන රළ උස නොවේ) ඉහළ යාමේ හැකියාව පවතී.

ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.

<u>කන්කසන්තුරය සිට මන්නාරම හරහා පුත්තලම දක්වා වන මුහුදු ප්‍රදේශවල ධිවර සහ නාවුක කටයුතුවල නොයෙදෙන ලෙස අවවාද කරනු ලැබේ.</u>

පුත්තලම සිට ගාල්ල හරහා හම්බන්තොට දක්වා වන මුහුදු ප්‍රදේශවල ධීවර හා නාවුක කටයුතු වල යෙදීමේදී මේ පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිනු ලැබේ.

**2021 මැයි මස 16 දින උදෑසන 05.30 ට නිකුත් කරන ලදි.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**WEATHER FORECAST FOR SEA AREAS AROUND THE ISLAND DURING NEXT 24 HOURS**
**Issued at 05.30 a.m. on 16 May 2021**

**The Cyclonic Storm 'TAUKTAE" over south east Arabian sea is intensified into a Severe Cyclonic Storm and lay centered at 11.30 p.m. of 15th May, near latitude 14.4°N and longitude 72.7°E. It is very likely to intensify into a Very Severe Cyclonic Storm within next 06 hours. The system is likely to move nearly north-northwestwards and cross Gujarat coast India around 18th May evening.**

**Naval and fishing communities are advised not to venture the above mention sea areas.**

**Condition of Rain:**

Showers or thundershowers will occur at times in the sea areas extending from Kankasanturai to Galle via Mannar and Colombo. Showers or thundershowers will occur at several places in the other sea areas around the island.

**Winds:**

Winds will be westerly to south-westerly in the sea areas around the island. Wind speed will be (40-50) kmph in the sea area extending from Kankasanturai to Puttalam via Mannar. Wind speed will be (30-40) kmph in the other sea areas around the island.

Wind speed can be increased up to 60 kmph in the sea area extending from Kankasanturai to Puttalam via Mannar and wind speed can be increased up to 50 kmph in the sea in the sea area extending from Puttalam to Hambantota via Colombo and Galle.

**State of Sea:**

**The sea areas extending from Kankasanturai to Puttalam via Mannar will be rough to very rough. The sea area extending from Puttalam to Hambantota via Colombo and Galle can be rough at times. The other sea areas can be fairly rough.**

**There is a possibility that near shore sea areas off the coast extending from Mannar to Hambanthota via Galle, may experience surges due to the effect of swell waves, having 2.0 – 32.5 m height (This is not for land area).**

**Temporarily strong gusty winds and very rough seas can be expected during thundershowers**

**Naval and fishing communities are advised not to venture in the sea areas extending from Kankasanturai to Puttalam via Mannar.**

**Fishing and naval community are requested to be vigilant in the sea area extending from Puttalam to Hambantota via Colombo and Galle.**

Rainfall amount (mm): Light: 00-12.50, Light to moderate: 12.50-25, moderate: 25-50, Fairly Heavy rain: 50 -100, Heavy rain: 100 – 150, Very heavy rain: 150 or more.

වර්ෂාපතනය(මි.මී) : සිහින් වැසි: 00-12.50, සිහින් හෝ මද වැසි: 12.50-25, මද වැසි: 25-50, තරමක් තද වැසි: 50 -100, තද වැසි:100 – 150, ඉතා තද වැසි: 150 හෝ ඊට වැඩි